# සිංහ ගෝත්‍රිකයන්ගේ දේශපාලන ආධිපත්‍යය

දේවානම්පිය තිස්ස රජු අශෝක රජුගේ යටත් රජකු ලෙස සිටි බවට කිසිම සාධකයක් නැතත් එසේ වී යැයි කීමට කැමති ඉතිහාසඥයෝ හා පඬියෝ මෙරට සිටිති. ඔවුන්ට අවශ්‍ය කරන්නේ හැකිනම් දේවානම්පිය තිස්ස රජු අශෝක රජුගේ යටත් රජකු ලෙස බුදුදහම පිළිගත් බව පෙන්වීමට ය. වෙනත් වචනවලින් කිවහොත් දේවානම්පිය තිස්ස රජු තවත් දොන් ජුවන් ධර්මපාල කෙනකු බවට පත්කිරීමට ය. දොන් ජුවන් ධර්මපාල කතෝලික ආගම වැළඳගත්තේ පෘතුගීසීන්ගේ යටත් රජකු ලෙස ය. ඇතැම් කතෝලික පඬියන්ට ද දේවානම්පිය තිස්ස රජුට දොන් ජුවන්ගේ දීනකම ආරූඪ  කිරීමේ අවශ්‍යතාව වෙයි.

එහෙත් එවැනි දීනකමක් ඓතිහාසික ව පෙන්නුම් කළ නො හැකි ය. කලින් සඳහන්කර ඇති පරිදි දේවානම්පියතිස්ස රජු අශෝක රජුගේ යටත් රජකු වී නම් සිංහල රාජ්‍යය මෞර්යයන්ගෙන් නිදහස් කරගත් රජකු පිළිබඳ සඳහන් විය යුතු ය. එසේ නිදහස දිනාගත් රජකු නොමැති නම් ඉන් කියැවෙන්නේ එක්කෝ දේවානම්පිය තිස්ස රජු යටත් නොවූ බව ය. එසේත් නැත්නම් අප තවමත් මෞර්ය රාජ්‍යයට යටත් බව ය. මෞර්ය රාජ්‍යය මේ වන විට නොමැති බැවින් අඩුම තරමින් මෞර්ය රාජ්‍යය නැතිවන තුරු අප ඒ රාජ්‍යයට යටත් ව සිටි බව ඉන් ගම්‍ය වෙයි. එසේ නම් ඒ පිළිබඳ සඳහනක් වංසකතාවල නොමැති නම් භාරතයේ ජනප්‍රවාදයෙහි හෝ තිබිය යුතු ය.

අප මෞර්ය රාජ්‍යය නැතිවන තුරු එහි යටත් රාජ්‍යයක් වී නම් ඒ නැතිවන විට අප නිදහස ලැබූ බවටවත් සඳහනක්, එවකට සිංහල රජතුමා කවුද යන්න පිළිබඳ සඳහනක්, යම්කිසි තැනක තිබිය යුතු ය. මෙකී කිසිවක් නැති විටෙක කිවහැක්කේ එකම එක දෙයකි. එනම් දේවානම්පිය තිස්ස රජු අශෝක රජුගේ යටත් රජකු වීය යන්න සිංහල බෞද්ධ විරෝධී පඬියන්ගේ ද්වේෂ සහගත හිතළුවක් පමණක් බව ය. ඔවුන්ට ප්‍රශ්නය වී ඇත්තේ දීන රජකු ලෙස කතෝලික ආගම වැළඳගත් දොන් ජුවන් ධර්මපාලගේ දීනත්වයට දේවානම්පිය තිස්ස රජු හෙළීමට නොහැකි වීම ය.

අප මෙතෙක් සාකච්ඡා කර ඇති දෙයින් පැහැදිළි වනුයේ පඬුඅබා රජු යක්ෂ ගෝත්‍රිකයකු නොවන බව ය. පඬුඅබා කුමරු දොරමඬලාවෙහි දී යක්ෂ සංස්කෘතියෙහි හැදී වැඩී ඇති බවත් යක්ෂ ගෝත්‍රිකයන් යම් පිරිසක් සමග කුමරාගේ සම්බන්ධකම් තිබූ බවත් පැහැදිළි ය. කුමරු වැඩුණු පසු කෙළේ කුමක් ද යන්න මිළඟ ප්‍රශ්නය ය. එතුමා උපතින් සිංහ වංශයට මෙන් ම ශාක්‍ය වංශයට ද සම්බන්ධ වූ අර්ධ වෛදිකයෙක් විය. එහෙත් සංස්කෘතියෙන් යක්ෂ විය.

එකල වන විට අර්ධ වෛදිකයන් මෙරටට පැමිණ සියවස් පහක් පමණ ගත වී තිබුණි. ආරම්භයේ සිට ම යක්ෂ ගෝත්‍රිකයන් හා සිංහ වාංශිකයන් අතර සටන් ඇති වී තිබෙන බව පෙනී යයි. නාග හා අනෙක් ගෝත්‍ර අර්ධ වෛදිකයන්ට යටත්වී හෝ ඔවුන් සමග යම් එකඟතාවකට පැමිණ හෝ ඇති බව පැහැදිලි ය. විශේෂයෙන් ම රුහුණට පැමිණි අර්ධ වෛදිකයන්, බොහෝ විට සිංහ වංශයට නොව වෙනත් වංශවලට අයත් අර්ධ වෛදිකයන්, නාග හා දේව ගෝත්‍ර සමග සම්බන්ධකම් ගොඩනගා ගන්නට ඇතැයි සිතිය හැකි ය.

එයට හේතුව වන්නට ඇත්තේ අර්ධ වෛදිකයන්ගේ හා නාග, දේව ආදී ගෝත්‍රිකයන්ගේ චින්තන හා සංස්කෘති අතර එතරම් වෙනසක් නොවීම විය හැකි ය. එකම සංස්කෘතියක ජනතාව අතර ද අරගල ඇතිවන බැවින් මෙය එතරම් පිළිගත හැකි හේතුවක් නොවේ යැයි කිසිවකුට කිව හැකි ය. එසේ අරගල ඇතිවුවත් එකම සංස්කෘතියක අයට ඉක්මනින් ඒ අරගල සමතයකට පත්කර ගත හැකි ය. අපේ ඉතිහාසයේ අර්ධ වෛදිකයන් හා නාග, දේව ආදී ගෝත්‍ර අතර විරෝධතා ගැන වැඩි සඳහනක් නොවීමට හේතුව එය විය හැකි ය.

සිංහ වාංහිකයන් හා යක්ෂ ගෝත්‍රිකයන් අතර වූ සටන් අවසානයේ දී  ජයග්‍රාහකයා යන අරුත දෙන විජය නමැත්තා මෙරට තම්මැන්නාව උපතිස්ස ආදී ගම් ආශ්‍රිත ප්‍රදේශයක යක්ෂ ගෝත්‍රිකයන් පරදවා සිංහ වංශයේ ආධිපත්‍යය පිහිටුවා ඇති බව පැහැදිලි ය. මේ ජයග්‍රහණයේ දී ඔහුට පෙම්බැඳ ඔහු සමග විවාහ වූ යක්ෂ ගෝත්‍රික කුමාරිකාවක වූ කුවේණියගේ සහාය ද ලැබී ඇති බව සිතාගත හැකි ය. අද පවා එවැනි දේ සිදුවන බැවින් මෙහි අමුත්තක් තිබිය නො හැකි ය.

© Prof. Nalin De Silva

යක්ෂ ගෝත්‍රිකයන් පරාජය වූ නමුත් ඇතැම් යක්ෂයන් ගැමුණු හා පසුව මහසෙන් යුගවලදීත් සිංහ වාංශිකයන්ට අවනත නොවූ බව පැහැදිලි ය. පොළොන්නරු යුගයේදී ද මේ විරසකය යම් ප්‍රමාණයකට තිබූ බව කාලිංගයෙන් පැමිණි නිස්සංකමලල රජුගේ කතාවෙන් පැහැදිලි වෙයි. විවිධ අරධ වෛදිකයන් මෙරට කිරුළට උරුමකම් කියමින් දඹදිවින් (භාරතයෙන්) පැමිණ ඇත්තේ වරක් දෙවරක් නො වෙයි. කාලිංග මාඝ පවා ද්‍රවිඩ නොවන බව අමතක නොකළ යුතු ය. නිස්සංකමලල රජුගේ සුප්‍රසිද්ධ ශිලා ලේඛනයෙන් කියැවෙන්නේ මෙරට රජකමට යක්ෂ ගෝත්‍රිකයකු පත්කර නොගත යුතු ය යන්න ද බව සොයා බැලිය යුතු ය.

ඒ කෙසේ වෙතත් පඬුඅභා කුමරු සිංහයන් ලානය නොකළ බව නම් පැහැදිලි ය. එතුමා කර ඇත්තේ සිංහ වාංශික ආධිපත්‍යය යටතට ඇතැම් යක්ෂ ගෝත්‍රියන් ද එකතුකර ගැනීම ය. ඒ වන විට ඇතැම් යක්ෂ ගෝත්‍රිකයන් ද සිංහ වාංශිකයන් සමග කරන සටන්වලින් හෙම්බත් වී සිටි බව නිසැක ය. ඔවුන්ට අරධ වෛදිකයන් සමග යම් සම්මුතියක් අවශ්‍ය ව තිබෙන්නට ඇත. පඬුඅබා කුමරු අතින් තම මාමාවරු වැඩි ගණනක් හා ඇතැම් සිංහ වාංශිකයන් මරණයට පත්වූ බව නිසැක ය. එයට හේතුව කුමක් ද? අභය කුමරු, එනම් පඬුවස්දෙව් රජුගෙන් පසු රජකමට පත්වූ වැඩිමහල් කුමරු හා ස්වර්ණපාලි කුමරියගේ පියා හැරෙන්නට අනෙක් මාමාවරු මරාදමන්නට ඇති හේතුව කුමක් ද?

ඇතැම් පඬියන්ට අනුව ඒ හුදෙක් බල තණ්හාව ය. එහි බල තණ්හාවක් නැතැයි අපි නො කියමු. එහෙත් මෙහි දී සිදුවන්නට ඇත්තේ එයට වඩා විශේෂිත වූ දෙයකි. අරධ වෛදිකයන් සමග සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමට කැමති යක්ෂයන් මෙන් ම අකමැති යක්ෂ ගෝත්‍රිකයන් සිටි පරිදි ම යක්ෂ ගෝත්‍රිකයන් සමග සම්බන්ධකම් ගොඩනගා ගැනීමට කැමති මෙන් ම අකමැති අරධ වෛදිකයන් ද සිටින්නට ඇත. අභය රජු හා ස්වර්ණපාලි කුමරියගේ පියා යක්ෂ ගෝත්‍රිකයන් හා සම්බන්ධකම් ගොඩනගා ගැනීමට කැමැත්තක් දැක්වූ අරධ වෛදිකයන් වන්නට ඇත. අනෙක් මාමාවරු යක්ෂ ගෝත්‍රිකයන්ට විරුද්ධ වූ අය විය හැකි ය.

එසේ ම චිත්තරාජ හා කාළදේව යනු අරධ වෛදිකයන් සමග සම්බන්ධකම් ගොඩනගා ගැනීමට උත්සාහ දැරූ යක්ෂ ගෝත්‍රික නායකයන් වන්නට ඇත. ඔවුන් රජ මාළිගයෙහි සේවයට පැමිණීම ද මෙහි දී නොසළකා හැරිය නො හැකි ය. නාරද වික්‍රමගේ මහතා පෙන්වා දෙන අයුරු දොරමඬලාව යනු අරධ වෛදිකයන් සමග සම්බන්ධකම් ගොඩනහා ගැනීමට උනන්දුවක් දැක්වූ යක්ෂ ගෝත්‍රිකයන්ගේ ගමක් විය හැකි ය. ඔවුන්ගේ නායකයකු පඬුඅබා කුමරු හදාවඩා ගැනීමට කැමැත්ත දැක්වීම ද අහම්බෙන් සිදු නොවන්නට ඇත. එසේ ම මේ ගම චිත්තරාජ හා කාළදේව යන යක්ෂ ගෝත්‍රික නායකයන්ගේ ප්‍රතිපත්තියට පක්ෂපාති වූවන්ගේ ගමක් වීමට ඇති ඉඩකඩ බොහෝ ය.

පඬුඅබා රජු අතින් ඝාතනය (ලානය) වන්නට ඇත්තේ සියළු සිංහ වාංශිකයන් (පිය පාර්ශ්වයෙන් හෝ උභය පාර්ශ්වයෙන් හෝ) නොව යක්ෂ ගෝත්‍රිකයන් සමග සම්බන්ධකම් ගොඩනගා ගැනීමට විරුද්ධ වූ සිංහ වාංශිකයන් විය යුතු ය. එවැනි සිංහ වාංශිකයන් නැතිකළ එතුමා තම හිතැති යක්ෂ ගෝත්‍රිකයන් ද සමගින් අනෙක් ගෝත්‍ර ද යක්ෂ ගෝත්‍රිකයන්ට විරුද්ධ නොවූ සිංහ වාංශිකයන් ද අඩුම තරමින් රුහුණේ ශාක්‍ය වාංශිකයන් ද (එතුමාගේ පියා වූ දීඝ ගාමිණී - උස හෙවත් ලොකු හෙවත් දික් හෙවත් දිගා වූ ගාමිණී  රුහුණු රට ශාක්‍ය වාංශිකයෙක් විය) තවත් අරධ වෛදිකයන් ද එකතු කර ගනිමින් සිංහල ජාතිය ගොඩනැගීම ආරම්භ කර ඇත.

එසේ ගොඩනගන ලද සිංහල ජාතියේ ප්‍රධාන වංශය - මහාවංශය - සිංහ වංශය විය. ජාතිය සිංහල වූයේ සිංහ වංශය නමින් ය. මහාවංසය නමැති පොත එලෙස නම් කෙරී ඇත්තේද එයින් ප්‍රධාන වංශයේ කතාව ද කියැවෙන බැවිනි. සිංහල ජාතියට සිංහ වංශයෙන් බාහිර අර්ථකථන දීමට තැත්කිරීම තවත් හුදු ප්‍රයත්නයක් පමණක් වෙයි. අද ක්‍රියාත්මක වන වෙනත් ප්‍රයත්න මෙන් ම එය ද සිංහල ජාතියේ අදීනත්වය නැතිකිරීමට ගන්නා තවත් ප්‍රයත්නයක් පමණකි. පඬුඅබා රජු තමන්ට මව් පාර්ශ්වයේ සීයාගෙන් උරුම වූ සිංහ වංශය අත් නො හැරියේ ය.

එහෙත් දූරදර්ශී වූ එතුමා සිංහල ජාතියේ සංස්කෘතියේ වැදගත් සංරචකය යක්ෂ සංස්කෘතිය බවට පත් කෙළේ ය. එතුමා ද ඒ සංස්කෘතියේ ම හැදී වැඩීම එයට එක් හේතුවක් වන්නට ඇත. එහෙත් එයට තවත් හේතුවක් ද තිබෙන්නට ඇත. සිංහල ජාතියේ දේශපාලන බලය සමස්තයක් ලෙස ගත්කල සිංහ හෙවත් ප්‍රධාන වංශයට හිමිවිය. එයට යක්ෂ

© Prof. Nalin De Silva

ගෝත්‍රිකයන් සහභාගි නොවූවා නො වෙයි. පඬුඅබා රජු නොයෙකුත් අවස්ථාවල චිත්තරාජ නම් යක්ෂ ගෝත්‍රික ප්‍රධානියාට තම අසුනට සමාන අසුනක් පැන වූ බව වංසකතාවෙහි සඳහන් වෙයි. ඉන් කියැවෙන කතාව දේශපාලන බලය පිළිබඳ වූවකි. එහි ජිතෘත්වයක් ගැන කතාවක් නැත. රාජසභාවක අසුන් පණවන්නේ දේශපාලන බලය මුල්කරගෙන මිස ඥාති සම්බන්ධකම් මුල් කරගනිමින් නො වෙයි. රාජසභාවෙහි ධුරාවලියක් වෙයි. වැදගත් වන්නේ ධුරාවලිය මිස ඥාතීත්වය නො වෙයි.

චිත්තරාජගේ අසුනෙන් නිරූපණය වූයේ රාජ්‍යත්වයේ යක්ෂ ගෝත්‍රිකයන්ට හිමි තැන මිස පඬුඅබා රජුගේ පියාට හිමි වූ තැන නොවන බව පැහැදිලි ය. පඬුඅබා රජුට අවශ්‍ය වූයේ යක්ෂ ගෝත්‍රිකයන් සිංහල රාජ්‍යයට ඇතුළත් කර ගැනීම මිස අනෙකක් නො වෙයි. එහි දී චිත්තරාජගෙන් ලත් උපකාරය එතුමා අමතක නොකළා පමණක් නො වේ. එසේ අමතක කර රාජ්‍යය පවත්වාගෙන යෑම ද දුෂ්කර බව එතුමා වටහා ගත්තේ ය. කෙසේ වෙතත් දේශපාලන වශයෙන් සිංහ වංශයට මුල් තැන ලැබුණ ද සිංහල ජාතිය කෘෂිකර්මය සමග බැඳුණු ජාතියක් විය. විශේෂයෙන් ම වැව එහි දී ප්‍රධාන විය. වැව් තැනුවෝ යක්ෂ ගෝත්‍රිකයෝ ය. ඒ සඳහා තාක්ෂණය තිබුණේ අඩුම තරමින් මුල දී ඔවුන්ට ය. ගොවිතැන තම ප්‍රධාන ජීවනෝපාය කරගත් සමාජයක ආර්ථික හා සංස්කෘතික කටයුතුවල දී මුල්තැන ලැබෙන්නේ ගොවිතැනට ප්‍රධාන වශයෙන් සම්බන්ධ වූ ගෝත්‍රයට වීම ස්වාභාවික ය. ඒ එසේ නොවන්නේ දේශපාලන බලය යොදා ඒ නැතිකළ හොත් ය. පඬුඅබා රජුට එසේ කිරීමේ වුවමනාවක් නො තිබුණි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva